**එළවළු සංවර්ධන මණ්ඩලය - 2017**

--------------------------------------------

එළවළු සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරනලදී. ඇවර කිරීමේ කටයුතුවලට අදාල ගනුදෙනු පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත ඡේදයන්හි දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2. මූල්‍යප්‍රකාශන**

------------------

**2.1 මතය**

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------

**2.2.1 ඈවර කිරීමේ කටයුතු ප්‍රමාද වීම**

--------------------------------------

2013 අප්‍රේල් 04 දිනැති අංක13/0361/536/005 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණු අතර ඈවර කිරීමේ කටයුතු 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එසේ වුවත් ඈවර කිරීමේ කටයුතු 2019 සැප්තැම්බර් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ ඌනතාවය රු.20,384 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවරු.138,884 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.118,500 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයේ ලැබිය යුතු පොලිය ලාභයෙන් කපා හැර තිබීම එයට හේතු වී තිබුණි.

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 21 3(1) වගන්තිය ප්‍රකාරව යම් හිමිකම් පෑමක් වෙනුවෙන් ගෙවීම සඳහා අරමුදල් යොදා ගැනීමෙන් පසු ඉතුරුවන යම් අතිරික්තයක් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරිය යුතු වුවද, ජංගම ගිණුමේ රු. 2,675,406 ක මුදලක් 2017 ජනවාරි 1 දින සිට භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතිණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------------

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------------

2003 ජූනි 02දිනැති අංක පීඊඩී/12දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 552 ක ප්‍රමාදයකින් පසුව 2019 සැප්තැම්බර් 04 දින ඉදිරිපත් කර තිබුණි.